62055

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** පහත දැක්වෙන්නේ මිනිස් අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ කිහිපයකි.

A - අසීමිත වීම
B - නිර්මාණය කළ හැකි වීම
C - විවිධ වීම
D - පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වීම
E - සීමිත වීම
F - පොදු වීම

ඉහත දෑ අතුරෙන් මිනිස් වුවමනාවලට අදාළ ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) A, B, D (2) A, B, C (3) A, C, E (4) B, D, E (5) B, D, F (......)

**2.** පහත වගුවේ **X** තීරුව මගින් මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ඇල්මැති පාර්ශ්වකරුවන් කිහිපදෙනෙක් ද, **Y** තීරුව මගින් ඔවුන් ඒ සඳහා උනන්දු වීමට හේතු කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. වාර්තාකරුවන් | 1. මාධ්‍ය වෘත්තිකයින්ගේ අයිතීන් තහවුරු කිරීමට |
| B. මහජනතාව | 2. තොරතුරු රැස් කිරීමට |
| C. රජය | 3. තොරතුරු කළමනාකරණයට |
| D. මාධ්‍ය වෘත්තිකයින්ගේ වෘත්තිය සංගම් | 4. තොරතුරු මගින් දැනුවත් වීමට |
| E. මාධ්‍ය ආයතන පරිපාලකයින් | 5. තොරතුරු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයට |

ඇල්මැති පාර්ශ්වකරුවන් හා ඔවුන් උනන්දුවක් දැක්වීමට හේතු නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 5, D - 3, E - 4
(2) A - 1, B - 3, C - 4, D - 5, E - 2
(3) A - 2, B - 4, C - 5, D - 1, E - 3
(4) A - 3, B - 1, C - 2, D - 4, E - 5
(5) A - 5, B - 2, C - 3, D - 4, E - 1

(......)

**3.** පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට අදාළ පාරිසරික සාධකවල ප්‍රවණතා කිහිපයකි.

A - ආර්ථිකයේ මිල මට්ටම් ඉහළ යාම
B - සේව්‍ය-සේවක ගැටුම් වර්ධනය වීම
C - තරගකාරිත්වය වැඩි වීම
D - සේවක පිරිවැටුම අඩු වීම
E - රඳවාගත් ඉපැයීම් අඩු වීම
F - පාරිභෝගික සමිතිවල බලය වැඩි වීම
G - අමුද්‍රව්‍ය අපතේ යාම අඩු වීම
H - වයස්ගත ජනගහනය වැඩි වීම

ඉහත දෑ අතුරෙන් අභ්‍යන්තර පාරිසරික සාධකවල ප්‍රවණතා පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C, D (2) A, D, E, G (3) B, C, E, H (4) B, D, E, G (5) C, F, G, H (......)

[ දෙවැනි පිටුව බලන්න.

4. පහත වගුවේ X තීරුවේ විවිධ ව්‍යාපාර ආයතන වර්ග හා Y තීරුවේ ඒවා ලියාපදිංචි කළ යුතු ආයතන ලැයිස්තුවක් ද දැක් වේ.

| X | Y |
|---|---|
| A. කොටස් නියෝජිත සමාගම් | 1. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| B. රක්ෂණ සමාගම් | 2. ශ්‍රී ලංකා මහ බැංකුව |
| C. බලපත්‍රලාභී බැංකු | 3. ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිසම |
| D. සමූපකාර ග්‍රාමීය බැංකු | 4. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය |

ව්‍යාපාර ආයතන වර්ග හා ඒවා ලියාපදිංචි කළ යුතු ආයතන නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.
(1) A - 1, B - 3, C - 2, D - 4
(2) A - 4, B - 1, C - 3, D - 2
(3) A - 1, B - 2, C - 4, D - 3
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 3, B - 1, C - 2, D - 4
(……)

5. ගනුදෙනුකරුවකු නිශ්චිත සන්නම් නාමයකින් ටින් කළ ආහාර වර්ගයක් ව්‍යාපාරිකයකුගෙන් ඉල්ලූ විට ඔහු විසින් ඒ වෙනුවට වෙනත් සන්නම් නාමයක ටින් කළ ආහාර වර්ගයක් ලබා දුන්නේ ය. එම භාණ්ඩයේ අන්තර්ගතය පිළිබඳව ලේබලයෙහි සඳහන් නොවීම නිසා ගනුදෙනුකරු ඒ පිළිබඳව ව්‍යාපාරිකයාගෙන් විමසූ විට ඔහු එය නොසලකා කටයුතු කළේ ය. මෙම සිද්ධියට අනුව කඩ වී ඇති පාරිභෝගික අයිතීන් ගණන
(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි. (5) 6 කි. (……)

6. ව්‍යාපාර සංවිධානවලට සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A - ණයකර නිකුත් කිරීමට හැකි වීම
B - වගකීම අසීමිත වීම
C - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
D - ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්ය වීම
E - ස්වාධීනව තීරණ ගැනීමට හැකි වීම
F - මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම අනිවාර්ය වීම
ඉහත දැ අතුරෙන් කේවල ස්වාමි ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ අඩංගු කාණ්ඩය තෝරන්න.
(1) A, B, C (2) A, C, E (3) B, C, E (4) B, D, F (5) C, D, F (……)

7. හවුල් ව්‍යාපාර සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - හවුල්කරුවන් අතර ලිඛිත ගිවිසුමක් පැවතීම අත්‍යවශ්‍ය වේ.
B - ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචිය අත්‍යවශ්‍ය වේ.
C - නෛතික පුද්ගලභාවයක් නොමැත.
D - උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව හවුල් ගිවිසුමකට තීරණය කළ හැක.
E - හවුල්කරුවන්ගේ වගකීම අසීමිත ය.

More Past Papers at
tamilguru.lk

ඉහත දැ අතුරෙන් හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ
(1) C පමණි.
(2) C සහ E පමණි.
(3) C, D සහ E පමණි.
(4) A, B, C සහ E පමණි.
(5) A, B, C, D සහ E සියල්ල ම.
(……)

8. සීමාසහිත පොදු සමාගමක ලක්ෂණයක් **නො වන්නේ**
(1) උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව පිළිබඳ සීමාවක් නොමැති වීමයි.
(2) අධ්‍යක්ෂවරුන්ගේ උපරිම සංඛ්‍යාවක් නොමැති වීමයි.
(3) කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම අනිවාර්ය වීමයි.
(4) ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර ණය ගෙවීමේ හැකියාව (නුබුන්වත් බව) පරීක්ෂා කළ යුතු වීමයි.
(5) කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට හැකි වීමයි.
(……)

9. පහත දැ අතුරෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ව්‍යවසායකයා ව්‍යාපාරිකයෙකි.
(2) ව්‍යවසායකයා කළමනාකරුවෙකි.
(3) ව්‍යවසායකයා වෘත්තිකයෙකි.
(4) ව්‍යවසායකයා විශ්ලේෂකයෙකි.
(5) ව්‍යවසායකයා අවස්ථා සොයන්නෙකි.
(……)

10. පහත සඳහන් දැ අතුරෙන් තැන්පතු භාර ගැනීමට **නො හැකි** මූල්‍ය ආයතන වර්ගය වන්නේ
(1) ඒකක භාර ය.
(2) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ය.
(3) බලපත්‍රලාභී විශේෂිත බැංකු ය.
(4) ප්‍රාදේශීය සංවර්ධන බැංකු ය.
(5) බලපත්‍රලාභී වාණිජ බැංකු ය.
(……)

11. පහත සඳහන් දැ අතුරෙන් ශ්‍රී ලංකා මහා බැංකුවේ සෘජු සුපරීක්ෂණයට යටත් වන ආයතන වර්ග සංඛ්‍යාව කීය ද?
A - බලපත්‍රලාභී වාණිජ බැංකු
B - බලපත්‍රලාභී විශේෂිත බැංකු
C - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
D - සමූපකාර ග්‍රාමීය බැංකු
E - සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (……)

**12.** පහත දැක්වෙන්නේ විද්‍යුත් ණය කාඩ්පතක සඳහන් මූලිකාංග කිහිපයකි.

A - ණයපත් සංගමයේ ලාංඡනය
B - කාඩ්පතේ අංකය
C - චුම්භක පටිය
D - කාඩ්පත් හිමියාගේ නම
E - සේවා දුරකථන අංකය
F - කල් ඉකුත් වන දිනය
G - අත්සන් පටිය

ඉහත දෑ අතුරෙන් විද්‍යුත් ණය කාඩ්පතක මුහුණතෙහි සඳහන් මූලිකාංග පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, E, F (2) A, B, D, F (3) B, C, E, G (4) C, E, F, G (5) D, E, F, G (......)

**13.** පහත දැක්වෙන්නේ රථවාහන සම්බන්ධ අවදානම් කිහිපයකි.

A - දිරාපත් වීම
B - හදිසි අනතුරු
C - සොරකම් කිරීම
D - වෙළෙඳපොළ අගය අඩු වීම
E - විකිණීමෙන් සිදුවිය හැකි අලාභය
F - තෙවැනි පාර්ශ්වයකට සිදු වන හානිය

ඉහත දෑ අතුරෙන් මෝටර් රථ රක්ෂණය යටතේ රක්ෂණය කළ හැකි අවදානම් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) A, B, C (2) A, C, D (3) A, E, F (4) B, C, D (5) B, C, F (......)

**14.** පහත ප්‍රකාශ අතුරෙන් රක්ෂණයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඕනෑ ම අවදානමක් රක්ෂණය කළ හැකි ය.
(2) කුලී නිවැසියාට තමන් වාසය කරන නිවස රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.
(3) දේපළක් රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කර ඇති විටෙක, එයට සිදු වන හානියක් සඳහා වන්දි සෑම සමාගමකින් ම වෙන් වෙන්ව ලබා ගත හැකි ය.
(4) සේවායෝජකයාට තම සේවකයින් රක්ෂණය කළ හැකි ය.
(5) හානිපූරණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ වේ. (......)

**15.** පහත ප්‍රකාශ අතුරෙන් ප්‍රවාහන පද්ධතියට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) බස් නැවතුම්පොළ ප්‍රවාහන පර්යන්තයේ අංගයකි.
(2) දුම්රිය මාර්ගය ප්‍රවාහන මාධ්‍යයේ අංගයකි.
(3) ගුවන්යානය ප්‍රවාහන බලයේ අංගයකි.
(4) නැව ප්‍රවාහන මාර්ගයේ අංගයකි.
(5) වරාය ප්‍රවාහන මාධ්‍යයේ අංගයකි. (......)

More Past Papers at
tamilguru.lk

**16.** පහත දැක්වෙන්නේ කළමනාකරණ ශ්‍රිතවලට සම්බන්ධ කාර්යයන් කිහිපයකි.

A - ශ්‍රම විභජනය
B - පාරිසරික විශ්ලේෂණය
C - සමායෝජනය
D - අරමුණු ස්ථාපිත කිරීම
E - කාර්යයන් හඳුනාගැනීම
F - දෙපාර්තමේන්තුකරණය
G - සන්නිවේදනය

ඉහත දෑ අතුරෙන් සංවිධානකරණ ශ්‍රිතයට අදාළ කාර්යයන් පමණක් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) A, B, C, F (2) A, B, D, G (3) A, C, D, G (4) A, C, D, E (5) A, C, E, F (......)

**17.** පහත වගුවේ **X** තීරුව මගින් මෙහෙයුම් ක්‍රියාකාරකම් කිහිපයක් ද, **Y** තීරුව මගින් මෙහෙයුම් කළමනාකරණ ශ්‍රිතයන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. නිෂ්පාදනයට අවශ්‍ය ශ්‍රමය තීරණය කිරීම | 1. සැපයුම් දාම කළමනාකරණය |
| B. තොග පාලනය | 2. නිෂ්පාදන ඉංජිනේරුකරණය |
| C. නිෂ්පාදන කාලසටහන් සකස් කිරීම | 3. නිෂ්පාදන පාලනය |
| D. සැපයුම්කරුවන් සංවර්ධනය කිරීම | 4. නිෂ්පාදන සැලසුම් කිරීම |

මෙහෙයුම් ක්‍රියාකාරකම් හා මෙහෙයුම් කළමනාකරණ ශ්‍රිත නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4
(2) A - 2, B - 1, C - 4, D - 3
(3) A - 2, B - 3, C - 1, D - 4
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 4, B - 3, C - 2, D - 1 (......)

**18.** පහත වගුවේ **X** තීරුව මගින් අලෙවිකරුගේ දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය හා **Y** තීරුව මගින් පාරිභෝගික දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය දැක්වේ.

| X | Y |
|---|---|
| A. නිෂ්පාදිතය | 1. පහසුව |
| B. මිල | 2. සන්නිවේදනය |
| C. ප්‍රවර්ධනය | 3. පාරිභෝගික විසඳුම (අවශ්‍යතා හා වුවමනා) |
| D. ස්ථානය (බෙදා හැරීම) | 4. පිරිවැය |

අලෙවිකරුගේ දෘෂ්ටිකෝණයෙන් හා පාරිභෝගික දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4
(2) A - 2, B - 1, C - 3, D - 4
(3) A - 2, B - 3, C - 4, D - 1
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 3, B - 4, C - 1, D - 2 (……)

**19.** පහත දැක්වෙන්නේ මූල්‍ය කළමනාකරණ තීරණ කිහිපයකි.

A - කෙටි කාලීන ආයෝජන
B - උපචිත වියදම්
C - ලාභාංශ විභජනය
D - ණය ප්‍රාග්ධනය
E - ප්‍රාග්ධන සංචිත
F - හිමිකාරිත්ව ප්‍රාග්ධනය

ඉහත දැ අතුරෙන් ප්‍රාග්ධන ව්‍යුහ පිළිබඳ තීරණ පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, E (2) A, D, E (3) B, E, F (4) C, D, E (5) D, E, F (……)

**20.** නිෂ්පාදන ආයතනයක දැනට යන්ත්‍ර ක්‍රියාකරුවන් 80 දෙනෙකු සිටින අතර නිෂ්පාදන ප්‍රමාණ හා යන්ත්‍ර ක්‍රියාකරුවන් සංඛ්‍යාව අතර ඍජු සහසම්බන්ධතාවයක් පවතී. ආයතනය ඉදිරි වර්ෂයේ දී නිෂ්පාදනය 25% කින් වැඩි කිරීමට තීරණය කර ඇත. යන්ත්‍ර ක්‍රියාකරුවන් 16 දෙනෙකු ඉල්ලා අස්වීමේ ලිපි භාර දී ඇති අතර ඉදිරි වසර තුළ විශ්‍රාම යෑමට නියමිත යන්ත්‍ර ක්‍රියාකරුවන් සංඛ්‍යාව 04 කි. යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ සිට සුපරීක්ෂක තනතුරට උසස්වීම් ලැබීමට නියමිත සංඛ්‍යාව 05 කි. අවශ්‍ය සේවක සංඛ්‍යාවෙන් 40%ක් බාහිරෙන් බඳවා ගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය නම් අභ්‍යන්තරයෙන් බඳවා ගත යුතු යන්ත්‍ර ක්‍රියාකරුවන් සංඛ්‍යාව කොපමණ ද?

(1) 13 (2) 18 (3) 20 (4) 21 (5) 27 (……)

**21.** පහත දැ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) දුරස්ථ පාලකය (Remote controller) ස්ථිරාංගයකි (Firmware).
(2) මධ්‍ය සැකසුම් ඒකකය (CPU) ජීවිකාංගයකි.
(3) මොනිටරය මෘදුකාංගයකි.
(4) පද්ධති ක්‍රියාකරු දෘඪාංගයකි.
(5) වෙබ් අඩවි දත්තයකි. (……)

**22.** ආනයන ක්‍රියාවලියේ දී භාවිතා වන 'ණයවර ලිපියකට' සම්බන්ධ **නොවන** පාර්ශ්වය වන්නේ

(1) ආනයනකරු ය.
(2) අපනයනකරු ය.
(3) ආනයනකරුගේ බැංකුව ය.
(4) අපනයනකරුගේ බැංකුව ය.
(5) රක්ෂණ සමාගම ය. (……)

**23.** ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් තොරතුරු වර්ගීකරණයෙහි නිර්ණායකය වන්නේ

(1) මූලාශ්‍රයයි.
(2) කළමනාකරණ මට්ටමයි.
(3) සම්භාවිතාවයි.
(4) ස්වභාවයයි.
(5) කාලයයි. (……)

**24.** 'රැකියා විස්තරයක්' යනු රැකියාවකට අයත්

(1) කාර්යයන්, යුතුකම්, වගකීම් හා සේවා කොන්දේසි අඩංගු ලැයිස්තුවකි.
(2) සුදුසුකම්, වගකීම්, කාර්යයන් හා තොරතුරු අඩංගු ලැයිස්තුවකි.
(3) සුදුසුකම්, වගකීම්, යුතුකම් හා කාර්යයන් අඩංගු ලැයිස්තුවකි.
(4) කාර්යයන්, සේවක ගුණාංග, යුතුකම් හා සුදුසුකම් අඩංගු ලැයිස්තුවකි.
(5) යුතුකම්, පලපුරුද්ද, සේවා කොන්දේසි හා වගකීම් අඩංගු ලැයිස්තුවකි. (……)

**25.** ආයතනයක් සෑම මට්ටමක ම සේවකයින්ගෙන් සමන්විත කමිටුවක් මගින්, ආංශික සැලසුම් පදනම් කරගෙන 2018-2020 කාලසීමාව සඳහා ව්‍යාපාරයේ සංයුක්ත සැලැස්ම සකස් කරනු ලබයි.
මෙම ප්‍රකාශයේ අඩංගු සැලසුම් කිරීමේ මූලධර්ම ගණන

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (……)

[ පස්වැනි පිටුව බලන්න.

**26.** 'සම්බන්ධතා අලෙවිකරණ සංකල්පය' වඩාත් හොඳින් විස්තර කරන අලෙවිකරණ කාර්යයන් අඩංගු ප්‍රකාශය වන්නේ
(1) ගනුදෙනුකරුවන්ගේ දිගුකාලීන තෘප්තිය හා විශ්වාසය තහවුරු කිරීම යන්නයි.
(2) සමාජයේ දිගුකාලීන අවශ්‍යතා තෘප්තිමත් කිරීම යන්නයි.
(3) සමාජ ජාල භාවිත කරමින් ගනුදෙනු සිදු කිරීම යන්නයි.
(4) භාණ්ඩ හා සේවා අවසාන පාරිභෝගිකයන්ට අලෙවි කිරීම යන්නයි.
(5) වෙළෙඳපොළ තරගයට මුහුණදීමට අලෙවි ප්‍රවර්ධනය භාවිතා කිරීම යන්නයි. (......)

**27.** සේවකයින් තෝරා ගැනීමක දී භාවිත කරන පරීක්ෂණ ක්‍රමය හා එහි අරමුණ නිවැරදිව සඳහන් වන ප්‍රකාශය තෝරන්න.
(1) විවිධ මානසික හැකියා පරීක්ෂා කිරීමට බුද්ධි පරීක්ෂණ යොදා ගනී.
(2) අවස්ථාවට මුහුණදීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමට පසුබිම් පරීක්ෂාව යොදා ගනී.
(3) විශේෂ වෘත්තීය කුසලතා පරීක්ෂා කිරීමට වෛද්‍ය පරීක්ෂණ යොදා ගනී.
(4) අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට ප්‍රායෝගික පරීක්ෂණ යොදා ගනී.
(5) අත් අකුරු පරීක්ෂා කිරීමට අභියෝග්‍යතා පරීක්ෂණ යොදා ගනී. (......)

**28.** ව්‍යාපාර සැලැස්මක් සැකසීමේ මූලික අරමුණ
(1) ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගැනීම ය.
(2) ව්‍යාපාර ශක්‍යතාවය ඇගයීම හා පවත්වාගෙන යාමට මග පෙන්වීම ය.
(3) විවිධ පාර්ශ්වකරුවන්ට ව්‍යාපාරය ගැන අවබෝධයක් ලබා දීම ය.
(4) ව්‍යාපාරය සඳහා යෝග්‍ය ස්ථානයක් තෝරා ගැනීම ය.
(5) රජයේ ප්‍රතිලාභ ලබා ගැනීම ය. (......)

More Past Papers at
tamilguru.lk

**29.** 'අණකරු විමසනු' යන අගරු සටහන චෙක්පතක යොදන්නේ කිනම් අවස්ථාවක ද?
(1) අණකරු විසින් ගෙවීම් නතර කර ඇති අවස්ථාවක
(2) අණකරු බුන්වත් වී ඇති අවස්ථාවක
(3) චෙක්පතෙහි ලිඛිත වැරදි ඇති අවස්ථාවක
(4) ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථාවක
(5) 'ගානිෂි' නියෝගයක් ලැබී ඇති අවස්ථාවක (......)

**30.** අලෙවිකරණ කළමනාකරුවන් විසින් ප්‍රජා විද්‍යා පරිසරය විශ්ලේෂණය කිරීමට බලපාන ආසන්නතම හේතුව වන්නේ
(1) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා අධ්‍යයනය කිරීම ය.
(2) පාරිභෝගික චර්යාවේ විචලතාව හඳුනා ගැනීම ය.
(3) වෙළෙඳපොළ ඛණ්ඩන විශාලත්වය හා වර්ධනය හඳුනා ගැනීම ය.
(4) ව්‍යාපාර චක්‍රය පුරෝකථනය කිරීම ය.
(5) දේශපාලන වෙනස්වීම් හඳුනා ගැනීම ය. (......)

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) භාණ්ඩවලට හෝ සේවාවලට ඇති .................................... මත ඉල්ලුම ජනිත වන අතර .................. .............................. මඟින් එය සඵල ඉල්ලුමක් බවට පරිවර්තනය වේ.

(ආ) ව්‍යාපාර, රටක ............................................ හා ................................................ සඳහා දායක වේ.

**32.** (අ) ව්‍යාපාර ක්‍රියාකාරකම් හොඳ හා නරක වශයෙන් ඇගයීම් කොට හොඳ දේ ක්‍රියාත්මක කිරීම ව්‍යාපාර ............................... ලෙස ද, මානව හා ස්වාභාවික පරිසර සංවර්ධනයට ව්‍යාපාරවල ඇති ධනාත්මක බැඳීම ............................................ ලෙස ද හැඳින්වේ.

(ආ) දුම්කොළ හා මද්‍යසාර බදු .................................... දෙපාර්තමේන්තුව මඟින් එකතු කරන අතර, උපයන විට ගෙවීම් (PAYE) බදු ............................................ දෙපාර්තමේන්තුව විසින් එකතු කරයි.


**33.** (අ) ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුමක මූලික අරමුණු වන්නේ භාණ්ඩ හා සේවා සඳහා ............................... නිර්මාණය කර ගැනීම හා ජාත්‍යන්තර ................................ වර්ධනය කර ගැනීමයි.

(ආ) බිල්පත් ඉක්මනින් ගෙවීම .......................... වට්ටම් මඟින් උනන්දු කරන අතර ...................... වට්ටම් මඟින් වැඩි භාණ්ඩ ප්‍රමාණයක් මිල දී ගැනීමට උනන්දු කරවයි.

**34.** (අ) කොළඹ කොටස් හුවමාරුවෙහි කිසියම් ලැයිස්තුගත සමාගමක කොටස්, මූල්‍ය යෝග්‍යතාවය, …………………… …………… හා ……………………………… යන නිර්ණායක සපුරන්නේ නම් පමණක් ඒවා S&P SL20 දර්ශකයට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබයි.

(ආ) අරමුදල් සම්පාදනයේ දී ……………………………… කල්බදු ක්‍රමය මගින් කල්බදු ලාභියාට අයිතිය නොපවරා දේපළ භාවිතයට පමණක් ඉඩ දෙනු ලබන අතර …………………………… කල්බදු ක්‍රමය මගින් අවදානම හා ප්‍රතිලාභ කල්බදු ලාභියාට පවරමින් දේපළ භාවිතයට ඉඩ දෙයි.

**35.** සන්නිවේදන ක්‍රියාවලියට අදාළ පහත සටහනෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.




**36.** (අ) අධිකාරී බලය ස්ථාපිත වී ඇති ආකාරය අනුව සංවිධානයක් …………………………………… හා ………………………………… වශයෙන් වර්ග කළ හැකි ය.

(ආ) කළමනාකරුවන්ට සංයුක්ත සැලැස්මක් සකස් කිරීමේ දී මූලිකව ම තිබිය යුත්තේ …………………………… කුසලතා වන අතර අවසාන ගිණුම් සකස් කිරීමේ දී ඔවුනට ………………………… කුසලතා තිබිය යුතු වේ.

**37.** පහත දැක්වෙන සමීකරණවල **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

| | **සමීකරණය** | | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|---|
| 1. | සමච්ඡේදන ලක්ෂ්‍යය | = ස්ථාවර පිරිවැය ÷ දායකය | ……………………… |
| 2. | දායකය | = ඒකකයක විකුණුම් මිල ÷ ඒකකයක විචල්‍ය පිරිවැය | ……………………… |
| 3. | ක්ෂණික අනුපාතය | = මුළු වත්කම් ÷ ජංගම වගකීම් | ……………………… |
| 4. | පොලී ආවරණ අනුපාතය | = පොලී හා බදුවලට පෙර ලාභය ÷ පොලිය | ……………………… |

**38.** (අ) නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කරනු ලබන්නේ ……………………………… අභිමුඛ නායකත්වය වන අතර සේවක අභිමුඛ නායකත්වය…………………………………… කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

(ආ) නියමිත සේවා කාලයට අමතරව වැඩ කරන කාලය වෙනුවෙන් ගෙවන්නේ ………………………………… වන අතර ඉලක්කගත ප්‍රමාණයට වඩා වැඩියෙන් කරන නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ………………………… ගෙවනු ලබයි.

**39.** (අ) හරිත නිෂ්පාදනයේ දී භාවිත කළ හැකි අපතය කළමනාකරණ ක්‍රියාකාරකම් තුන වනුයේ, අවම කිරීම (Reduce), ……………………………………… හා ……………………………………… වේ.

(ආ) වටිනාකම හා ප්‍රමාණය අනුව වර්ග කර තොග පාලනය කිරීම …………………………… ක්‍රමය ලෙස ද, ශුන්‍ය මට්ටමක් පවත්වා ගනිමින් තොග පාලනය කිරීම ……………………………… ක්‍රමය ලෙස ද හඳුන්වයි.

**40.** (අ) ගනුදෙනුකාර වටිනාකම යනු පාරිභෝගිකයා කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳ සංජානනය කරගනු ලැබූ (හඳුනා ගත්) …………………………සමග………………………… ගැළපීමයි.

(ආ) අඩු …………………………… හා පුළුල් …………………………… ආවරණය නිසා අන්තර්ජාලය තුළින් කෙරෙන අලෙවි ප්‍රවර්ධනය ජනප්‍රිය වෙමින් පවතී.

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

More Past Papers at
tamilguru.lk

**41.** පහත ප්‍රමිතීන්ට අදාළ පද්ධති සහතිකකරණය (ක්ෂේත්‍රය) ලියන්න.

1. ISO 9001 : 2015 ..........
2. ISO 14001 : 2015 ..........
3. ISO 22000 : 2005 ..........
4. ISO 26000 ..........

**42.** ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර සඳහා රජය විසින් ලබා දෙන මූල්‍ය **නොවන** දිරිගැන්වීම් වර්ග **හතරක්** දක්වන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**43.** විද්‍යුත් වෙළෙඳාම සිදු වන ආකාර **හතරක්** සඳහන් කරන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**44.** වෙළෙඳපොළ ඛණ්ඩනයක සඵලදායිතාව තහවුරු කර ගැනීමට තිබිය යුතු අවශ්‍යතා **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**45.** ව්‍යාපාරයකට ලබා ගත හැකි සෘජු මූල්‍ය සම්පාදන මාර්ග **හතරක්** දක්වන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**46.** කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග **හතරක්** නම් කරන්න.


1. ..........
2. ..........
3. ..........
4. ..........


[ අටවැනි පිටුව බලන්න.


**47.** ආයතනයක මානව සම්පත් කළමනාකරණයේ සාර්ථකත්වය ඇගයීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක **හතරක්** සඳහන් කරන්න.


1. ..........................................................................
2. ..........................................................................
3. ..........................................................................
4. ..........................................................................

**48.** පහත සඳහන් රූපසටහන්වලින් නිරූපණය කෙරෙන පරිගණක ජාල නම් කරන්න.

1.  ..........................................

2.  ..........................................

3.  ..........................................

4.  ..........................................

**49.** දත්ත සැකසීමේ තාක්ෂණය වර්ග කළ හැකි ආකාර **හතර** නම් කරන්න.

1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

**50.** ව්‍යාපාරයක ශක්‍යතා අධ්‍යයනයේ දී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර **හතරක්** සඳහන් කරන්න.

1. ..........................................................................
2. ..........................................................................
3. ..........................................................................
4. ..........................................................................

* * *

More Past Papers at
tamilguru.lk

62055

AL/2017/32/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>வணிகக் கல்வி II<br>Business Studies II | 32 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

✻ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) (අ) ව්‍යාපාරයක අරමුණු **හතරක්** ලැයිස්තුගත කරන්න.

(ආ) “නිෂ්පාදිත, භාණ්ඩ හා සේවාවලට පමණක් සීමා නොවේ.” නිෂ්පාදිත වශයෙන් සැලකිය හැකි භාණ්ඩ හා සේවා **නොවන** දෑ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණයට අනුව ‘ලී බඩු’ හා ‘ශබ්දමාලාව’ (Glossary) යන භාණ්ඩ අයත් වන වර්ගීකරණය වෙන වෙන ම දක්වන්න.

(ආ) ඉහත (ii) (අ)හි ඇති භාණ්ඩ දෙක ඔබ සඳහන් කළ වර්ගීකරණයන්ට අයත් වන්නේ ඇයි දැයි හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) පසුගිය වසර කිහිපය තුළ සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබුනු දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වීමට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) සමහර ව්‍යාපාර ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික අංශ තරගකාරීව ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින නමුත් පෞද්ගලික අංශයට වඩා රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලින් තම අවශ්‍යතා සපුරාගැනීමට ජනතාව පෙළඹීමට බලපාන කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීම, අවස්ථාවක් විය හැකි කර්මාන්තයක් හා තර්ජනයක් විය හැකි කර්මාන්තයක් බැගින් නම් කර, ඊට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(v) කිසියම් කර්මාන්තයක තරගකාරිත්වය වර්ධනය වීම, අදාළ කර්මාන්තයේ නියුතු ව්‍යාපාර ආයතනයක නිෂ්පාදිත හා මිල සම්බන්ධ තීරණවලට බලපාන ආකාර **දෙක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

2. (i) (අ) විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජයකට අනුගමනය කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම රජයක අරමුණකි. ඔබ, බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක නියුතු වී සිටින්නකු නම්, මෙම අරමුණ ඉටුකරලීමට ව්‍යාපාරිකයකු ලෙස ඔබට දායක විය හැකි ආකාර **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ආදායම් බදු හා එකතු කළ අගය මත අය කරන බදු (VAT) සංසන්දනය කරමින් ඒවා අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න.

(ආ) බැංකු ණය පොලී අනුපාත වැඩි කිරීම, දේපළ වෙළෙඳාම් (Real estate) ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාරිකයකුට බලපාන ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) “රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර ආයතන වර්ග අතුරෙන් රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථාවලට වඩා ව්‍යාපාර තරගකාරිත්වයට මුහුණ දීමට යෝග්‍ය වේ.” මෙම ප්‍රකාශය තහවුරු කිරීමට කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ශ්‍රී ලංකාවේ ‘සමුපකාර ව්‍යාපාරය’ ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි හඳුනාගත හැකි ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) වරලත්හිමියකු විසින් වරලත්ලාභියකු තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** ලියන්න.

(ලකුණු 04 යි)

(v) සනත් සහ පියල් යන දෙදෙනා ලිඛිත ගිවිසුමකින් තොරව රු. 100 000 බැගින් යොදා, ඖෂධ අලෙවි කිරීම සඳහා ‘XY සහ සමාගම’ නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. දී ඇති තොරතුරු පදනම් කරගෙන, ආරම්භ කිරීමට යන මෙම හවුල් ව්‍යාපාරයට අදාළ මූලික නෛතික පනත් **හතරක්** සඳහන් කර, ඒවා අදාළ වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ දෙවැනි පිටුව බලන්න.

**3.** (i) "රටක සංවර්ධනයට වඩාත් අවශ්‍ය වන්නේ ව්‍යාපාරිකයින්ට වඩා ව්‍යවසායකයින් ය." මෙම ප්‍රකාශය, ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) අමල් කුඩා කළ සිට ම ව්‍යවසායකයකු වීමේ අදහසින් සිටි අයෙකි. නමුත් මූල්‍යමය වශයෙන් ශක්තිමත් නොවූ නිසා ඔහු සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි, අර්ධ අගනා මැණික් ගල් භාවිත කර විසිතුරු භාණ්ඩ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එය මේ වන විට දියුණු තත්ත්වයකට පත් වෙමින් තිබේ. මෙම සිද්ධියට අනුව ව්‍යවසායක ගති ලක්ෂණ **දෙකක්** හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) චෙක්පතක් රේඛනය කිරීම තුළින් අණකරුවකු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල අතර වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව (2016) ට අනුව ණය කාඩ්පත් භාවිතය රටෙහි මුළු ජනගහනයෙන් 6%කට ආසන්න ප්‍රමාණයකි.

(අ) ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය අඩු මට්ටමක පැවතීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ණය කාඩ්පත් භාවිතය වැඩි කිරීමට බැංකුකරුවකුට අනුගමනය කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) රටක විදේශ විනිමය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම එම රටෙහි විදේශ වෙළෙඳාමේ නියුතු ව්‍යාපාරවලට බලපාන ආකාර **දෙකක්** ලියන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල අධීක්ෂණ කටයුතු කිරීම, ගනුදෙනුකරුවන්ට හිතකර ලෙස බලපාන ආකාර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) (අ) පියසිරි විසින් දරුකමට හදාගනු ලැබූ වසන්ත වෙනුවෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණි. එහෙත් ළමා කාලයේ සිට පැවති රෝගයකින් වයස අවුරුදු 26 දී වසන්ත මිය ගියේ ය. පියසිරි විසින් වසන්තගේ ජීවිත රක්ෂණ ඔප්පුවට වන්දි ලබා ගැනීමට යෑමේ දී ඇතිවිය හැකි ගැටලු **දෙකක්** රක්ෂණ මූලධර්ම පදනම් කරගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) 'මහජන වගකීම් රක්ෂණය' යනු කුමක් දැයි විස්තර කර ඊට නිදසුනක් සපයන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ආයතනයක් විසින් සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) ගෝලීය තැන් සෙවුම් පද්ධතිය (Global Positioning System - GPS) භාවිත කිරීම මගින් භාණ්ඩ ප්‍රවාහනයේ දී ව්‍යාපාරිකයකුට ඇති වන වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) සිල්ලර වෙළෙඳ ක්ෂේත්‍රය තුළ සුපිරි වෙළෙඳසැල් ක්‍රමය ජනප්‍රිය වුව ද සාම්ප්‍රදායික සිල්ලර අලෙවිසැල් ද බහුලව පැවතීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) "භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියේ දී තොග වෙළෙන්දා අත්‍යවශ්‍ය පාර්ශ්වකරුවෙකි." මෙම අදහසට පක්ෂව හා විපක්ෂව කරුණු **දෙක** බැගින් සඳහන් කරන්න.

(ආ) 'පොදු වරණීය තීරුබදු සහනය +' (Generalized System of Preference - GSP+) යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 04 යි)

(v) (අ) විද්‍යුත් වෙළෙඳාමක් සිදු වන ආකාරයට අයත් පියවර ලැයිස්තුගත කරන්න.

(ආ) විද්‍යුත් ව්‍යාපාර (e-business) හා විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) අතර වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

**5.** (i) (අ) "නිවැරදි දෙයක් නිවැරදි ආකාරයට කිරීම" කළමනාකරණය ලෙස පීටර් ඩ්‍රකර් විසින් දක්වා ඇත. මෙම අදහසේ අඩංගු කළමනාකරණ මූලිකාංග **දෙක** සඳහන් කරන්න.

(ආ) හෙන්රි මින්ට්ස්බර්ග් විසින් විස්තර කළ, කළමනාකරුවකුගේ තීරණ ගැනීමේ භූමිකාවට අයත් උප භූමිකා **හතර** නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) පාලන විතස්ථිය (පාලන අවකාශය) තීරණය කිරීමට බලපාන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ආයතනයක සංවිධාන සටහන පිරමිඩාකාර හැඩයක් ගැනීමෙන් විදහා දැක්වෙන කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාරික ආයතනයක අරමුණුවල (Objectives) මූලික ගුණාංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර මොනවා ද?

(ආ) මෙහෙවර ප්‍රකාශයක අන්තර්ගත විය යුතු මූලිකාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) සැලසුම්කරණ ක්‍රියාවලියේ දී දැකිය හැකි ප්‍රායෝගික ගැටලු **හතරක්** ලියන්න.

(ආ) "සංවිධානයක ඉහළ මට්ටමේ කළමනාකරුවන්ට සෙසු කළමනාකරණ මට්ටම්වලට වඩා වැඩියෙන් සංකල්පනාත්මක කුසලතා තිබිය යුතු වේ." මෙම අදහසට පක්ෂව කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ තුන්වැනි පිටුව බලන්න.

6. (i) සංවිධානකරණයේ දී සිදුවිය හැකි දුර්වලතා **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) නෛතික බලය හැර කළමනාකරුවකුට බලය ලැබෙන වෙනත් මූලාශ්‍ර **හතරක්** නම් කර, ඉන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව හා නිර්බාධවාදී නායකත්ව ශෛලීන් අතර සමානකම් **දෙකක්** ලියන්න.

(ආ) වැඩබිම් මට්ටමේ (Floor-level) සේවකයින් අභිප්‍රේරණය කිරීම සඳහා ව්‍යාපාරයකට යොදා ගත හැකි ක්‍රම **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ආයතනයක, අවිධිමත් සන්නිවේදනයේ වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න.

(ආ) සංවිධාන ධුරාවලියේ ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය දක්වාත්, පහළ කළමනාකරණයේ සිට ඉහළ කළමනාකරණය දක්වාත් සන්නිවේදනය කෙරෙන තොරතුරු වර්ග **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(v) ගොඩනැගිලි ඉදිකරන්නකු වූ කමල්, කලින් කළ ඉදිකිරීම් ව්‍යාපෘතිවලදී ගොඩනැගිලි ද්‍රව්‍ය අපතේ ගිය බවත්, නියමිත වේලාවට ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වූ බවත් හඳුනාගෙන ඇත. ඉදිරි ව්‍යාපෘතිවලදී ද්‍රව්‍ය අපතේ යාම අඩුකර ගැනීමට හා නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට කමල්ට අනුගමනය කළ හැකි පාලන ක්‍රම **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

7. (i) නිෂ්පාදිතයක මට්ටම් පහ අතුරෙන් ඕනෑ ම මට්ටම් **හතරක්**, ජංගම දුරකථන නිදසුනක් ලෙස ගෙන විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී එහි යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි පරීක්ෂණ (ක්ෂේත්‍ර) **හතරක්** සඳහන් කරන්න.

(ආ) සඵලදායී හුවමාරුවක් සිදුවීමට සපුරාගත යුතු කොන්දේසි **හතරක්** ලැයිස්තුගත කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'පෑන්' සහ 'ඇස් කණ්ණාඩි' යන භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීමට වඩාත් යෝග්‍ය නිෂ්පාදන ක්‍රම (Production methods) සඳහන් කර, ඊට හේතු දක්වන්න.

(ආ) නිෂ්පාදන කර්මාන්ත ආයතනයක නිෂ්පාදන පිරියත නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) පසුගිය වසර කිහිපය තුළ ආයතනයක මෙහෙයුම් ආදායම ක්‍රමයෙන් අඩු වන තත්ත්වයක් පෙන්වයි. මෙම ආයතනයට මෙහෙයුම් ආදායම වැඩි කර ගැනීමට භාවිත කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) සීමාසහිත පොදු සමාගමක බාහිර අරමුදල් සම්පාදන මාර්ග **දෙකක්** නම් කර, ඒවායෙහි වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) ලිපිකරුවන් බඳවා ගැනීම සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් කැඳවීම තුළින් ආයතනයකට ඇති විය හැකි වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) මාස හයක පරිවාස කාලයකට යටත්ව මීට මාස පහකට පෙර නිමාලි, කළමනාකරණ සහකාරවරියක වශයෙන් ABC ආයතනයට බැඳුනා ය. ඇයගේ වැඩවල ගුණත්වය පිළිබඳ කළමනාකරණය සෑහීමකට පත් වී නොමැති නිසා නිමාලි පිළිබඳව කළමනාකරණයට ගත හැකි තීරණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) තොරතුරු පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා ව්‍යාපාරයකට භාවිත කළ හැකි ආරක්ෂිත ක්‍රම **හතරක්** දක්වන්න.

(ආ) දත්ත හා තොරතුරු සංසන්දනය කරමින්, ඒවා අතර පවතින වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) ආයතනයක මෙහෙයුම් මට්ටමේ දී ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) භාවිත කළ හැකි කළමනාකරණ ශ්‍රිත **දෙකක්** නම් කර, ඒවාට අයත් ගනුදෙනු සැකසුම් පද්ධති **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාර සැලැස්මක අංගයක් ලෙස මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

More Past Papers at
tamilguru.lk

* * *